# ගණිතය

## පළමුවන ශ්‍රේණිය

## තුන්වන වාරය

<u>ගුරු මාර්ගෝපදේශයට අනුව සම්පාදිතයි</u>

**සැකසුම : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**



# 1 සිට 9 තෙක් ක්‍රම සූචක සංඛ්‍යා හඳුනා ගැනීම



## ක්‍රියාකාරකම 01: කීවෙනියා දැයි බලමු

**සපයා ගත යුතු දේ -**

- පාඩම අවසානයේ ඇති සත්ත්ව රූප 9 කපා ගන්න.
- බිම තැබිය හැකි පරිදි කුඩා ලී කුට්ටි / යෝගට් කෝප්ප / ඉවතලන ගිනිපෙට්ටිවල එම රූප එකින් එක රූපයේ පරිදි අලවාගන්න.



**දෙමාපියන්ට උපදෙස් -**

- එම සත්ත්ව ආකෘති එකම දිශාවකට සිටින පරිදි කැමති ආකාරයකට එකෙකු පිටුපස අනෙකා සිටින පරිදි එක පෙළට තැබීමට දරුවා යොමු කරන්න .
- ඉන්පසු පළමුවෙනියා, දෙවෙනියා, තුන්වෙනියා, හතරවෙනියා, පස්වෙනියා, හයවෙනියා, හත්වෙනියා, අටවෙනියා, නවවෙනියා ලෙස දරුවාට සතුන් පෙන්වමින් කීමට යොමු කරන්න.
- එය හඳුනාගත් පසු පහත ප්‍රශ්න දරුවාගෙන් අසන්න . පිළිතුරු ලබා ගන්න. පිළිතුර නිවැරදි විය යුතුනම් පිළිතුර නිවැරදි කරවන්න.
    - ✓ පළමුවෙනියාට ඉන්නේ කවු ද?
    - ✓ හාවා ඉන්නේ කී වෙනියාට ද?
    - ✓ පස්වෙනියාට ඉන්නේ කවු ද?
    - ✓ අන්තිමයාට ඉන්නේ කවු ද?
    - ✓ අන්තිමයා කී වෙනියා ද?
    - ✓ අලියා කී වෙනියා ද?

**ක්‍රියාකාරකම 02 - කතන්දරයක් අසමු .**

- ඉහත ක්‍රියාකාරකම 01 හි භාවිත කළ සත්ත්ව ආකෘති මේ සඳහා ද භාවිත කරන්න .
- පහත කතන්දරය දරුවාට පවසන්න.
- "කැලේ යාළුවන් වූ හාවයි, ඉබ්බයි , ඉත්තෑවයි, බලුපැටියයි, පූසයි, මීයයි, අලිපැටියයි, තාරාපැටියායි, වඳුපැටියායි සෙල්ලම් කරන්න පිට්ටනියට ආවා. "අපි තරගෙට දුවමු" කියලා බලුපැටියා කිව්වා. හැමෝම තරගෙට දුවන්න කැමති වුණා. "මම එකයි දෙකයි තුනයි කියලා ගණන් කරන්නම්" කියලා ඉබ්බා කිව්වා. එකයි දෙකයි තුනයි කියලා තරගය පටන් ගත්තා. දැන් එක්කෙනා පසු පස එක්කෙනා වේගයෙන් දුවනවා."
- කතන්දරය කියන අතර ඒ ඒ ස්ථානවල සත්ත්ව ආකෘති තැබීමට දරුවා යොමු කරන්න.

✓ පළමුවෙනියාට දුවන්නේ බලුපැටියා
✓ දෙවෙනියාට දුවන්නේ හාවා
✓ තුන්වෙනියාට දුවන්නේ පූසා
✓ හතරවෙනියාට දුවන්නේ මීයා
✓ පස්වෙනියාට දුවන්නේ අලිපැටියා
✓ හයවෙනියාට දුවන්නේ ඉත්තෑවා
✓ හත්වෙනියාට දුවන්නේ වඳුපැටියා
✓ අටවෙනියාට දුවන්නේ තාරාපැටියා
✓ නවවෙනියාට දුවන්නේ ඉබ්බා

දැන් ඔක්කොම සත්තු වේගයෙන් දුවනවා . ඔන්න එකපාරටම හාවා පළවෙනියා වුණා. හතරවෙනියාට හිටපු මීයා දෙවෙනියාට දුවන්න ගත්තා. අන්තිමට දුවපු ඉබ්බා තාරපැටියාව පහු කරලා අටවෙනියා වුණා. ඔන්න ඒ විදියට දිනුම් කණුව පසු කළා.

- කතන්දරය නිම වූ පසු දැන් සතුන් සිටින ස්ථාන පිළිබඳ ව දරුවාගෙන් පහත ප්‍රශ්න අසන්න.
  1. පළමුවෙනි ස්ථානය ගත්තේ කවු ද ?
  2. දෙවෙනි ස්ථානය ගත්තේ කවු ද?
  3. ඉබ්බා සිටින්නේ කීවෙනි ස්ථානයේ ද?
  4. අනෙක් සතුන් ඉන්නේ කුමන ස්ථානවල ද ?

**ක්‍රියාකාරකම 03** :- වාහන එලවමු .

සපයා ගත යුතු දේ

- පහත දේවල්වලින් ඔබට පහසුවෙන් සපයා ගත හැකි දේ තෝරා ගන්න.
  - ✓ සෙල්ලම් වාහන හෝ
  - ✓ ඉවතලන හිස් සබන් පෙට්ටි / දත් බෙහෙත් පෙට්ටි ආදියෙන් සකස් කරගත් වාහන ආකෘති 09 ක්

**දෙමාපියන්ට උපදෙස් -**

- වාහන එකක් පසුපස එකක් එක දිශාවකට තබා ඒවා පිහිටි ස්ථාන පිළිබඳ පැහැදිලි කරදීමට දරුවාගෙන් පහත ප්‍රශ්න අසන්න .

1. පළමුවෙනියාට යන්නේ කුමන වාහනය ද ?
2. වාහනයක් නම් කර ( බසය ) යන්නේ කීවෙනියාට ද?
3. පස්වෙනියාට යන්නේ කුමන වාහනය ද ?

---

*ගණිතය වැඩ පොතේ පිටු අංක 50,51,52 හි අභ්‍යාස සඳහා දරුවාට මඟ පෙන්වන්න.*

---

















